# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 244 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 10/02/2024 පැය 2110

## මාධ්‍ය නිවේදනය

**01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම - මීගමුව පොලිස් වසම.**

2024.02.10 වන අද දින රාත්‍රි කාලයේ මීගමුව පොලිස් වසමේ ගල්කන්ද හංදිය ආසන්නයේ දී යතුරු පැදියකින් ගමන් කරමින් සිටි පුද්ගලයෙකුට වෙඩි තබා පල ගොස් ඇති බවත්, තුවාලකරු මීගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇති බවට මීගමුව පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවරුදු 60 ක් වූ මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් මෙම වෙඩි තැබීම සිදුකර ඇති බවට ඒ සඳහා පිස්තෝල වාර්ගයේ ගිණි අවියක් භාවිතා කර ඇති බවට පොලිසිය සැක කරනු ලබයි. ඝාතනයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. පලාගිය සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මීගමුව පොලිස් ස්ථානය මගින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම - මහකුඹුක්කඩවල පොලිස් වසම.**

2024.02.10 වන අද දින සවස් කාලයේ මහකුඹුක්කඩවල පොලිස් වසමේ සෙම්බුකුලිය ප්‍රදේශයේදී යතුරු පැදියකින් ගමන් කරමින් සිටි පුද්ගලයෙකුට සිදු කල වෙඩි තැබීමක් හේතුවෙන් තුවාල ලබා පුත්තලම රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇති බවට මහකුඹුක්කඩවල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවරුදු 54 ක් වූ සෙම්බුකුලිය, මහකුඹුක්කඩවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඉඩම් ආරවුලක් මෙම ඝාතනයට හේතුවී ඇති අතර, මරණකරු දිය නෑම සඳහා වැවට ගොස් ආපසු එමින් සිටියදී සැඟව සිටි සැකකරු විසින් මෙම වෙඩි තැබීම සිදු කර ඇති බව අනාවරණය වී ඇත. මෙරට නිෂ්පාදිත ගිණි අවියකින් මෙම වෙඩි තැබීම සිදු කර ඇති අතර, සැකකරු මහකුඹුක්කඩවල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත. සිද්ධිය සම්බන්ධයෙන් මහකුඹුක්කඩවල පොලිස් ස්ථානය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**